ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව |
| දිනය | **2017.01.23** |

## කොළඹ 05, විශාඛා විද්‍යාලයීය 100 වන සංවත්සරය වෙනුවෙන් සමරු කාසියක් නිකුත් කිරීම

**කොළඹ 05, විශාඛා විද්‍යාලයට වසර 100ක් පිරීම නිමිත්තෙන්, රටෙහි ප්‍රමුඛතම පාසලක් ලෙස එය ජාතියට සිදුකරන දායකත්වය ඇගයීමක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුහුණත වටිනාකම රු. 2000 ක් වන සංසරණය නොවන රිදී සමරු කාසියක් නිකුත් කරන ලදී.**

**ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා විසින් 2017.01.23 දින විශාඛා විද්‍යාලයීය ජෙරමියස් දියෙස් ශාලාවේදී, මෙහි පළමු කාසිය අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා වෙත නිල වශයෙන් පිළිගන්වනු ලැබීය.**

<u>කාසිය පිළිබඳ විස්තර</u>

| <u>කාසියේ මුහුණත</u> | <u>කාසියේ පිටුපස</u> |
|---|---|
|  |  |





කාසියේ මුහුණතෙහි සෙලෙස්තිනා ජෙරමියස් දියෙස් රුව සමහ "1917 විශාඛා විද්‍යාලය ශත සංවත්සරය 2017"යන අරුත කාසියේ ඉහළ දාරයේද "සෙලෙස්තිනා ජෙරමියස් දියෙස්" යන නාමය ඉංග්‍රිසි භාෂාවෙන් කාසියේ පහළින්ද දැක්වේ.

කාසියේ පිටුපසෙහි මැද කොටසේ රන් පැහැති ලාම්පුවක් දැක්වේ. කාසියේ මුහුණත වටිනාකම වන "2000" විශාල ඉලක්කම් සමහ ශ්‍රී ලංකාවේ මුදල් වල නම සිංහල, දෙමළ හා ඉංග්‍රිසි භාෂා වලින් ද ඊට පහළින් "2017" වර්ෂය ද දැක්වේ. කාසියේ ඉහළ දාරයේ "පඤ්ඤාය පරිසුජ්ඣති" යන වචන ඉංග්‍රීසි භාෂාවෙන්ද, රටෙහි නම දෙමළ, සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් කාසියේ පහළ දාරයේ ද දැක්වේ.

කාසිය පිළිබඳ විස්තර

| | |
|---|---|
| මුහුණත වටිනාකම | රු. 2000 |
| ටංකන ආකාරය | හිමාකාර |
| ලෝහය | රිදී (0.925), පහන රන් ආලේපිතයි |
| විෂ්කම්භය | මි.මී. 38.61 |
| බර | ග්‍රෑම් 28.28 |
| හැඩය | රවුම් |
| දාරය | කට්ට සහිත |
| නිකුතුව | කාසි 1000 |

**මෙම කාසිය රු. 12,200/- ක නියමිත මිලකට කොළඹ 05, විශාඛා විද්‍යාලයෙන් මිලදී ගත හැක.**

අධිකාරි
ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
නො. 30, ජනාධිපති මාවත
කොළඹ 01
ශ්‍රී ලංකාව.